
# මැඩිල්ල අමුණ එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමනාකරණ සැලැස්ම







| | | |
|---|---|---|
| **1.** | හැඳින්වීම | 3 |
| 1.1 | ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම: | 3 |
| 1.2 | මැඩිල්ල අමුණ එල්ලංගාව හා එහි පිහිටීම | 4 |
| 1.3 | මැඩිල්ල අමුණ එල්ලංගාව තිරසර ලෙසකලමණාකරනය කිරීමේ වැදගත්කම | 6 |
| 1.4 | එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම | 8 |
| 1.5 | එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය | 9 |
| 1.6 | එල්ලංගා පැතිකඩ සකස්කිරීමේ අවශ්‍යතාවය | 10 |
| 1.7 | මැඩිල්ල අමුණ එල්ලංගා පැතිකඩ සකස්කිරීමේ දී භාවිතා කල ක්‍රමවේදය | 13 |
| 1 .8 | එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කිරීමේ අරමුණු | 13 |
| 1.9 | එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම | 13 |
| 2. | එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ක්‍රමවේදය | 14 |
| 2.1 | තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම | 14 |
| 2.2 | මැඩිල්ල අමුණ එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම | 15 |
| 3. | මැඩිල්ල අමුණ එල්ලංගාවේ වර්තමානපැතිකඩ | 15 |
| 3.2 | භූ විද්‍යාත්මක (Geological)තොරතුරු | 19 |
| 3.3 | ජල විද්‍යාත්මක තොරතුරු | 23 |
| 4 | පරිසර විද්‍යාත්මක (Environmental)තොරතුරු | 25 |
| 4.1 | එල්ලංගාව තුල සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම් පිලිබඳ තොරතුරු | 25 |
| 4.2 | සමාජ ආර්ථික තොරතුරු | 28 |
| 5.0 | යෝජිත උපාය මාර්ග සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව හා සම්බන්ධිතයන් | 47 |
| 6.0 | ඇස්තමේන්තුගත වියදම | 32 |
| 7.0 | ක්‍රියාත්මක සැලැස්ම | 36 |
| | ඇමුණුම් | 39 |

## 01. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හදුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැගි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් ''දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ'' සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කලමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කලමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කලමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කර ඇත.එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

## 1.1මැඩිල්ල අමුණ එල්ලංගාව හා එහි හි පිහිටීම

මැඩිල්ල අමුණ එල්ලංගාව කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව මැතිවරණ කොට්ඨාශයේ පිහිටි අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් භූමි ප්‍රදේශය තුල පිහිටාඇත. අඹන්පොල එහි ප්‍රධාන නගරය ලෙස සැලකේ. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ කුරුණෑගල සිට කිලෝමීටර් 60ක පමණ දුරින් පිහිටා ඇති අඹන්පොල ඓතිහාසික රාජධානියක් වන යාපහුවට නුදුරින් පිහිටාඇත. පුරාවෘත වලට අනුව ඓතිහාසික වශයෙන් වැදගත්වන අනුරාධපුරය දක්වා ගමන් මාර්ගයේ අතරමග නවාතැන්පොලක් හෙවත් අම්බලමක් පිහිටි ස්ථානය පසුව අම්බලන්පොළ ලෙසද ඉන්පසු තවදුරටත් ව්‍යවාහාරයේදී අම්බලන්පොළ උච්චාරණපහසුව උදෙසා පසු කාලීනව අඹන්පොළ ලෙස හඳුන්වන ලද බවත් ලේඛණවල සඳහන්වේ.

මැඩිල්ල අමුණ එල්ලංගාව අඹන්පොල සිට නිකවැරටිය දක්වා දිවෙන මාර්ගයට ආසන්නයේ අඹන්පොල සිට කි මී 06 ක් පමන දුරින් පිහිටා ඇත. එම එල්ලංගාවට අයත්වන වැව් ලේඛණය මේ අනුව දැක්විය හැකිය. මෙම වැව් ව්‍යාපෘතියේ පුණරුත්ථාපන වැඩ සටහනට තෝරාගත් දැනටමත් පුණරුත්ථාපන කර ඇත. අවසන් වැව් ලේඛණයේ සඳහන්වේ. මෙම වැව් වලට අමතරව එල්ලංගාව ආරම්භයේ සිට අවසානය දක්වා


ජල සම්පත් විවිධ ස්ථාන වල රදවා ගැනීමට පුරාණ ගොවියා මහත් උත්සාහයක් දරා ඇත. ඒ අනුව එල්ලංගාව ආරම්භ වන ස්ථානයේ සිට ගලා එන ජල මාර්ග හරස් කරමින් ඉදිකර ඇති ලොකු කුඩා ජලාශ බොහෝය. මෙම ජල මාර්ග හා ජලාශ වර්තමානයේත් වෙනස් වෙමින් පවතී එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ජනගහන වර්ධනවත් සමග ඉඩම් අයිතියේ ඇතිවන වේගවත් වෙනස්වීමයි. මෙම තත්ත්වය එල්ලංගාවේ තිරසර පැවැත්මට ප්‍රබල බලපෑමක් ඇතිකරයි.

| | |
|---|---|
| 1 අටවරළ වැව | 2 විමලදාසගේ වැවන |
| 3 ජයවීරගේ වැව | 4 තරණගස් වැව |
| 5 කැප්පෙටියාව වැව | 6 සුද්දනාගේ වැව |
| 7 පත්තිනිගම වැව | 8 නැලැව මහ වැව |
| 9 නෙලුම්පත් වැව | 10 නැලැව කුඩා වැව |

ඉහතින් සදහන් වනුයේ මැඩිල්ල අමුණට අයත් වැව්ය. එහෙත් එල්ලංගාව නිරීක්ෂණයේ දී ජල සම්පත් ගබඩා කරගත් තවත් කුඩා වැව් කිහිපයක් ඇත. මෙම වැව් අතීතයේ ඉතා කුඩා ජල මූලාශ්‍ර පදනම් කරගත් පුද්ගලිකව ඉදිකරන ලද වැව් පද්ධතියකි. පසු කාලීනව අදියර කිහිපයකින් වත්මන් තත්වය දක්වා සංවර්ධණය වී ඇත. අතීතයේ ඉතා ප්‍රාථමික තත්වයේ මෙම වැව් පැවතියද එල්ලංගාවේ පැවතිය යුතු අංගෝපාංග සියල්ල පැවති බවට ශේෂව පවතින වැව් වල ලක්ෂණ අනුව නිගමනය කල හැකිය. එහෙත් යුග වශයෙන් කාලය ගෙවී යාම හා ජනගහන වර්ධනයත් සමග එල්ලංගාවේ පැවතිය යුතු බොහෝ අංගෝපාංග වර්ථමානය වන විට විනාශයට පත්ව ඇත. කට්ටකඩුව, ගස්ගොම්මන, පෝටා වැටිය, පෙරහන, ගොඩ වල, යනාදී ඉතා වැදගත් අංගෝපාංග අද දක්නට නැත. තවද වතීමාන ගොවි ප්‍රජාව මෙම අංගෝපංග පිළිබදව හෝ මෙම අංගෝපාංග එල්ලංගා පද්ධතිය තුල පිහිටා ඇත්තේ කුමන හේතුවකටද යන්න හදුනාගැනීමට පවා අවබෝධයක් නැත. මෙම හේතු නිසා එල්ලංගාව හායනයට පත් වීම වර්ථමානයේදී විසදාගත නොහැකි ගැටලුවක් දක්වා වර්ධනය වෙමින් පවතී. මෙහි අවසන් ප්‍රතිඵලය වන්නේ එල්ලංගාවේ වැව් ගොඩවීමයි.

## 1.2 මැඩිල්ල අමුණ එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා


අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්රදේශය තුල කුඩා පරිමාණයේ වැව් රාශියක් පිහිටාඇත. එකිනෙක මත යැපෙන මෙම වැව් එල්ලංගා පද්ධතීන් සමුහයක් නියෝජනයකරයි. සුලු පරිමාණ වැව් 133ක් සම්බන්ධයෙන් එල්ලංගා පද්ධති 22ක් අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පිහිටා ඇති අතර ඉන් විශාලතම එල්ලංගා පද්ධතිය වැව් 27කින් සමන්විත පිදුරුවල්ල එල්ලංගාව වන අතර මැඩිල්ල අමුණ එල්ලංගාව වැව් 10කින් යුක්ත වේ. මෙම එල්ලංගාව ආසන්නයෙන්ම පිහිටා ඇත්තේ අස්සැදුම එල්ලංගාවයි. මෙම එල්ලංගාව වැව් 02ක් ලේඛණ ගත වුවත් එහි වැව් සෙසු එල්ලංගා වල .පිහිටා ඇත 03 . දක්වා පරාසයක විහිදී පවතී 12 සිට 1 වැව් ව්‍යාපෘතිය මගින් තෝරාගත් එල්ලංගා 69 ක වැව් 15ක් පුණරුත්ථාපනය කර ඇත එහෙත් මෙම . එල්ලංගා නිරීක්ෂණය කරන විට තවත් ලොකු හා කුඩා වැව් රැසක් පිහිටා ඇත . එල්ලංගාව සැලකිල්ලට ගැනීමේදී මෙම සියලු වැව් වල ජල ධාරිතාවය සලකා බැලිය යුතුය තවද දෙවන අදියර යටතේ. මෙම . එල්ලංගාවේ තෝරාගත් වැව් 11 .පුණරුත්ථාපනය කිරීමට නියමිතය එල්ලංගා 15 කවැව් පුණරුත්ථාපනය කලද එල්ලංගා පද්ධති සංවර්ධන වැඩ සටහන යටතේ තෝරාගෙන ඇත්තේ වැව් ක් 03 හා ඊට වැඩි සංඛාවක් වැව් පවතින්නාවූ ඒ අනුව අඹන්පොල ප්‍රා . එල්ලංගා පමනි දේශීය ලේකම් කොට්ඨාශය තුලප්‍රා එල්ලංගා පද්ධති සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වන්නේ පද්ධති 09 ක වන අතර මෙම එල්ලංගා බොහොමයක් එකිනෙකට ආසන්නයේ පිහිටා ඇත .මෙම සිතියම මගින් එල්ලංගා පිළිබදව දළ අදහසක් ලබාදීමට උත්සාහගෙන ඇත.



## 1.3 මැඩිල්ල අමුණ එල්ලංගාවහා එහි හි පිහිටීම

මැඩිල්ල අමුණ එල්ලංගාව කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව මැතිවරණ කොට්ඨාශයේ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් භූමි ප්‍රදේශය තුල පිහිටා ඇත. අඹන්පොල එහි ප්‍රධාන උප නගරය ලෙස සැලකේ. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ කුරුණෑගල සිට කිලෝමීටර් 60ක පමණ දුරින් පිහිටා ඇති අඹන්පොල ඓතිහාසික රාජධානියක් වන යාපහුවට නුදුරින් පිහිටා ඇත. පුරාවෘතවලට අනුව ඓතිහාසික වශයෙන් වැදගත්වන අනුරාධපුරය දක්වා ගමන් මාර්ගයේ අතරමග නවාතැන්පොලක් හෙවත් අම්බලමක් පිහිටි ස්ථානය පසුව අම්බලන්පොළ ලෙසද ඉන්පසු තවදුරටත් ව්‍යවහාරයේදී අම්බලන්පොළ උච්චාරණ පහසුව උදෙසා අඹන්පොළ ලෙස හඳුන්වන ලද බවත් ලේඛණවල සඳහන්වේ. මැඩිල්ල අමුණ එල්ලංගාව පිහිටා ඇත්තේ අඹන්පොල සිට නිකවැරටිය දක්වා දිවෙන මාර්ගයට ආසන්නයේ ය. අඹන්පොල සිට කි.මී. 06ක් පමන බටහිර දෙසට වන්නටය. මෙම වැව් අතීතයේ ඉතා කුඩා ජල මූලාශ්‍ර පදනම් කරගත් පුද්ගලිකව ඉදිකරන ලද වැව් පද්ධතියකි. පසු කාලීනව අදියර කිහිපයකින සංවර්ධනය වී වත්මන් තත්වයේ පවතී. අතීතයේ ඉතා ප්‍රාථමික තත්වයේ මෙම වැව් පැවතියද එල්ලංගාවේ පැවතිය යුතු අංගෝපාංග සියල්ල පැවති බවට නටබුන් දක්නට ඇත. එහෙත් ක්‍රමයෙන් යුග වශයෙන් කාලය ගෙවී යාම හා ජනගහන වර්ධනයත් සමග එල්ලංගාවේ පැවතිය යුතු බොහෝ අංගෝපාංග වර්ථමානය වන විට හායනයට පත්ව ඇත. කට්ටකඩුව, ගස් ගොම්මන, පෝටා වැටිය, පෙරහන, ගොඩ වල, යනාදී ඉතා වැදගත් අංගෝපාංග අද දක්නට නැත. මෙම හේතුවෙන් එල්ලංගාවේ වැව් ගොඩ වීම අද වන විට විසදාගත නොහැකි ගැටලුවක් දක්වා වර්ධනය වෙමින් පවතී. එල්ලංගාව පරිහරණය කරන වත්මන් ප්‍රජාව මුළුමනින්ම මෙම තත්වයට වගකිව යුතුය. මෙහිදී ගොවි ප්‍රජාව විසින්

එල්ලංගාවට කර ඇති හානිය තක්සේරු කර සංවර්ධනයේදී ඊට ප්‍රමාණවත් මැදිහත්වීමක් ඔවුන්ගෙන් ලබාගත යුතුය.




පාංශු වයනය සහ අන්තර්ගතය මත පදනම්ව අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රධාන පාංශු වර්ග තුනක ව්‍යාප්තියක් පෙන්වයි. මෙම පාංශු වර්ග වන්නේ

අ) රතු පැහැයට හුරු දුඹුරු පස (RBE),
ආ) රතු පැහැයට හුරු දුඹුරු අඩු තෙතමනය සහිත ග්ලේ සහ
ඇ) අඩු හියුමික් ග්ලේ (LHG) පස,ජල මාර්ග අවට පහත් බිම්වල සහ කුඹුරුවල දක්නට ලැබේ.
(රූපය 3.2).

මැඩිල්ල අමුණ එල්ලංගාව තුල මෙම පාංශු වර්ග තුනම දක්නට ලැබේ. එල්ලංගාවේ සමස්ථ සිතියම හා දළ වශයෙන් සටහන් කර ඇති එල්ලංගා ව්‍යාප්තිය පිළිබඳව සලකා බැලීමේදී ගොවින්ගේ පදිංචියෙන් ප්‍රදේශයම ආවරණය කරයි. ඒ අනුව ගෙවතු වගාව හා වෙනත් මානව අවශ්‍යතාවන් සඳහා එල්ලංගාව යොදාගෙන ඇති බව පැහැදිලිව දක්නට ඇත. මේ අනුව මෙම එල්ලංගාව දැනටමත් ජනාකීරණ වී ඇති බවත් නිවාස හා වෙනත් ඉදිකිරීම් වලින් බහුල බවක් පෙන්වයි.

ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් මැඩිල්ල අමුණ එල්ලංගාව

වගු අංක 1

| | ග්‍රා නි කොට්ඨාශයේ නම හා අංකය | ව්‍යාප්තිය හෙ | ජනගහනය | | | ප්‍රදේශය තුල ගොවි සංවිධාන |
|---|---|---|---|---|---|---|
| | | | ස්ත්‍රී | පුරුෂ | එකතුව | |
| 01 | නෙලුම්පත් වැව | 681.31 | | | | 01 |
| 02 | කාසිකොටේ බටහිර | 862.42 | | | | 01 |
| 03 | කාසිකොටේ නැගෙනහිර | 735.55 | | | | |




අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ පිහිටීම හා එල්ලංගාවේ දළ සීමාවන්

## 1.4. එල්ළංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

වගු අංක 2

| තොරතුරු | විස්තරය |
|---|---|

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | කුරුණෑගල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අඹන්පොල |
| මැතිවරණ බල ප්‍රදේශය | යාපහුව |
| ගංගා ද්‍රෝණියේ නම | මී ඔය ගංගා දෝණිය |
| එල්ගංගාවේ නම | මැඩිල්ල අමුණ |
| ගොවිජන සේවා බල ප්‍රදේශය | අඹන්පොල |
| ග්‍රාම නිලධාරී වසම් | 3 |
| එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය හෙක්: | 2279.28 |
| ජල පෝශක ප්‍රදේශයේ නම | හිතෝගම ඇල හා අඹගම්මන ඇල |
| පැහැදිලි ජල පෝෂක සංඛ්‍යාව | 03 |
| කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන වැව් සංඛ්‍යාව | 10 |
| වනාන්තර ප්‍රදේශ | හෙ 13 |
| මුඩු බිම් | හෙක් 15 (හදුනාගත්) |
| එල්ලංගාව තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව | 184 |
| ගෙවතු | හෙ 470 |
| පුණරුත්ථාපනයට යොමු කල වැව් සංඛ්‍යාව | 7 |
| පුණරුත්ථාපනයට යොමු නොකල වැව් සංඛ්‍යාව | 3 |

## 1.5 මැඩිල්ල අමුණ එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම

මැඩිල්ල අමුණ එල්ලංගාව හෙක්ටයාර් 2279කින් සමන්විත වැව් 10කින් යුක්ත වේ. මෙම වැව් 10 අතරින් වැව් 4ක් ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කර ඇති අතර තවත් වැව් 03ක් පුණරුප්තාපනය කිරීමට නියමිතය. මෙම පද්ධතිය තුල කුඹුරු හා අතිරේක ආහාර බෝග වගාව අක්කර 570ක් පමනවේ. මෙම වගා කටයුතු වල නිරත වන ගොවීන් සංඛ්‍යාව 230ක් පමනවේ. මේ සමග ම එල්ලංගාව තුල සමස්ථ ජනගහනය 1739ක් පමන වාසය කරයි. මෙම සියලු දෙනා එල්ලංගාව තුල විවිධ මානුසික ක්‍රියාකාරකම් වල නිරතවේ. මේ අනුව එල්ලංගාව දැනටමත් විශාල හායනයකට පත්ව ඇත. කාලයක් තුල සිදුවී ඇති වණ විනාශය

අවිධිමත් හේන් හා ගොඩ ඉඩම් වගාව නිසා සිදුවන පාංශු බාදනය වැව් ඉස්මත්ත අනවසරයෙන් අල්ලාගෙන කුඹුරු වගා කිරීම වැනි ක්‍රියාකාරකම් නිසාම වැව් හා ඇල පද්ධතිය ගොඩවීම  එල්ගංගාව බලවත් තර්ජනයකට මුහුණ දීමට හේතුවී ඇත.  තව ද මෙවන්  කුඩා එල්ලංගාවක් වීමත් ජනගහන වර්ධනය හා ඉඩම් බෙදී යාමත් පවතින සම්පත් දිනෙන් දින  වේගයෙන් භාවිතයට ගැනීමත් නිසා  මෙම ප්‍රදේශවල  වැව් ජලය සීග්‍රයෙන් සිදී යාමේ තර්ජනයකට මුහුණ දෙමින් සිටී. ජල මාර්ග සිදී යමින් දේශගුණික විපර්යාශයන් අනුව මෙම තත්වය තව දුරටත් උග්‍ර වනුඇත. මෙම තත්වයෙන් මෙම එල්ලංගා පද්ධතිය බේරා ගැනීමට නම් වැව් පුණරුත්ථාපනය පමනක් කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. මෙම තත්වයට එකම විසඳුම වන්නේ සමස්ථ එල්ලංගාවම තිරසර ලෙස සංවර්ධනයට භාජනය කිරීමයි .  ඒ අනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස්කර මැඩිල්ල අමුණ එල්ලංගාව ආරක්ෂාකිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය මැඩිල්ල අමුණ එල්ලංගාව වෙත යොමුකර ඇත. එහිදී එල්ලංගා කළමනාකරණ කමිටුව එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර ඒ මගින් ක්‍රියාත්මක විය යුතුය. ඒ අනුව  එල්ලංගාවේ පහත අත්‍යාවශ්‍ය අංගෝපාංග ප්‍රසස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුව ඇත. එහි දී අනුගමනය කලයුතු ප්‍රධාන ක්‍රියාමාර්ග මෙසේය.

1 වැවේ පෝෂිත ප්‍රදේශය සංවර්ධනය. මේ යටතේ ප්‍රමාණවත් වෘක්ෂලතා ආවරණයක් පිහිටුවීම හා පවතින වෘක්ෂලතා කලාපය ආරක්ෂා කිරීම.

2 වැව් ඉස්මත්තේ සිදුකෙරෙනන අණවසර වගාවන් නිසා සිදවන  ප්‍රබල පාංශු බාදනය අවම කිරීමට පියවර ගැනීම. මෙහිදී වැව තුල අණවසරයෙන් කුඹුරු වගා කරන ගොවීන් ඉවත් කිරීම, වැව ඉස්මත්තේ හේන් වගා බිම් සඳහා පාංශු සංරක්ෂණ වැටි දැමීම, වැව වටා ශක්තිමත් පෙරණයක් (Filter ) යෙදීම. පවතින ගොඩ වල පුණරුත්ථාපනය  හෝ අවශ්‍ය ස්ථාන වල ආරක්ෂිත වැටි මගින්  වැවට ගලා එන ජලය මගින් ගෙන එන දැ අවම කිරීම. (වැව ගොඩවීමට බලපාන රොන් මඩ, වැලි සහ මැටි, ශාක හා සත්ව කොටස්)

3 වැවේ කට්ටකඩුව, ගස්ගොම්මන, ඉස් වැටිය යන අංගයන් නැවත පිහිටුවීම. වැවේ හා වාරිමාගී පද්ධතියේ නඩත්තුව විදිමත් පරිදි පවත්වාගෙන යාම. වැවේ රාජකාරී සම්බන්ධයෙන් පැරණි සිරිත් විරිත් නීති රීති අනුගමනය කිරීම හා  ක්‍රියාත්මක කිරීම.


4 එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුව මගින් නිරන්තරයෙන් එල්ලංගාව අධීක්ෂණය කරමින් තත්වය කළමනාකරණය කිරීම හා අදාල වගකිවයුතු ආයතන වල ප්‍රමාණවත් මැදිහත් වීම.

## 1.6 එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කලමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම්,"එල්ලන්" සහ "ගාව" යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ළඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.

## එල්ලංගාවක ආකෘතියක්

ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 චක්‍රලේඛයට අනුව (ඇමුණුම 01) එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපවකටයුතු කර එල්ලංගා කලමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.




එල්ලංගාවක ක්‍රියාකාරිත්වය

එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම් ,

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම්වරු,
- ගොවි සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන,
- ජල සම්පත් මණ්ඩලය,
- ආපදා කලමණාකරන කාර්යාංශය,
- පොලිස් දෙපාර්තමේන්තුව,
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය,
- පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය,
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව

යන ආයතන වේ. එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත.

**ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ දක්වා ඇත.**




**එල්ලංගා කලමණාකරන කමිටු රැස්වීමක්**



## 1.7 එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහ වැලි ව්‍යාපාරය හා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී. මෙම වැඩසටහන් ජලය හා බැදුනු මහා වාරිමාර්ග පදනම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් ISMP ව්‍යාපෘති ) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටු වීමේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදුවේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටු කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක දරණ ඡේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හදුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 1.8 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්,සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ.මේ සඳහා

එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ.එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කර ඇත. මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

### 1.9 එල්ලංගාපැතිකඩසහඑල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතුවේ. ඒ සඳහා  පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කලමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම එල්ලංගා

පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත්වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් විය යුතු පාර්ශවකාර ආයතනයන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබදව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

## 1.10 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හායනයට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිළිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදිව දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

## 2 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය

විශේෂිත උස් කඳු වැටි ප්‍රදේශය තුල දක්නට නොමැති අතර ප්‍රදේශයේ පවතින උන්නතාංශය අනුව එල්ලංගාවට ලැබෙන වර්ෂාවෙන් ගලා යන ජලයෙන් වැව් පෝෂණය වේ . ස්වාභාවික වනාන්තර දක්නට නැත. එල්ලංගාව තුල ගෙවතු වගාව හා නිවාස කෘෂිකාර්මික ඉඩම් පිහිටා ඇත. ලැබෙන වර්ෂාපතනය මෙම භූ විශමතාවය අනුව වේගවත්ව වැව් තලට ගලායයි. ප්‍රදේශයේ පවතින්නේ රැලි සහිත භූමියකි. මෙම භූ විශමතාවය අනුව ලැබෙන වර්ෂාපතනය වැව් වලට එක්වනවා හැර විශේෂිත ජල මාර්ග හෝ ඇලවල් නැත. **මැඩිල්ල අමුණ** එල්ලංගාව මෙන්ම ප්‍රදේශයේ සෙසු එල්ලංගා වලින් පිටතට ගලායන ජලය ඉගිනිමිටිය ජලාශයට රැස්වේ. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මුලුමනින්ම ඉගිනිමිටිය ජලාශයේ පෝෂිත ප්‍රදේශයේ ලෙස සැලකිය හැකිය.

## 2.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

එල්ලංගාව හෙක්ටයාර් **2279.28**කින් යුක්තය. මෙය ඉතා කුඩා වැව් කිහිපයකින් යුත් එල්ලංගාවකි. ජනාවාස අතර ලදු කැලෑව මෙම එල්ලංගාව තුල පිහිටා ඇත. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ භූමිය සාමාන්‍යයෙන් මෘදු බෑවුමක් හා රැලි සහිත තැනිතලාවකි. ජලාපවහන රටාව ප්‍රධාන වශයෙන් මීඔය ගංගා ද්‍රෝණියේ හා සම්බන්ධ වන අතර එය හිතෝ-ඇල සහ අඹගම්මන ඇල ප්‍රධාන ජල මූලාශ්‍ර වේ. අඹන්පොළ ප්‍රදේශයට දකුණු දෙසට පතිතවන වැසි ජලය දකුණු ප්‍රදේශයට ගලා බසින අතර එය දැදුරු ඔයට එකතුවේ. ප්‍රා. ලේකම් කොට්ඨාශයේ දක්නට ලැබෙන සියලු ස්වාභාවික ජලමාර්ග බොහෝ ස්ථානවල අවහිරකර ඇති අතර වගාව සඳහා ජලය රඳවා ගැනීමට කුඩා වැව් හා අමුණු රාශියක් ඉදිකර ඇත. වැසි සමයේදී, ජලය වේගයෙන් ගලායාම නිසා දැඩි පාංශු ඛාදනයක් සිදුවේ. මෙම ප්‍රා ලේකම් කොට්ඨාශය තුළ ඇති මුළු කුඩා වැව් වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කරයි. වියළි කාලවල දී භූගත ජලමට්ටම අඩි 30ක් පමණ ගැඹුරට දක්නට ලැබෙන අතර දැනට ඇතැම් ගම්මානවල කෘෂි ළිං සහ නළ ළිං හරහා මෙම ජලය ලබාගනී. වර්ෂාවෙන් ලැබෙන ජලය කාලීන ජල මාර්ග ඔස්සේ ගලා ගොස් සුලු කාලයකින් සිඳීයයි. මෙම කුඩා ජලාශවල වාන් දමන කාලයද ඉතා කෙටි වන්නේ වැව් ඉස්මත්තේ නිසි පෝෂිත ප්‍රදේශයක් නොමැති නිසාය .

## 2.3 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

මෙම එල්ලංගාව තුල වැව් 10 ක් පවතින අතර මෙම වැව් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනී. රැලි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්ථිර බෝග වගාවන්ගෙන් ව්‍යාප්ත වී ඇත. බොහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලේ පිහිටි කුඹුරු යායෙනි. මෙම වැව් තාවුල්ල හා බැඳුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත. වාර්ෂිකව වැව් ඉස්මත්තෙ කුඹුරු වගාව නිසා සේදී පහලින් පිහිටි වැවට එකතු වන රොන්මඩ හා පස් අංශු අති විශාලය. මෙය වාර්ෂිකව සිදුවේ. මෙහි ඉස්වැටිය පෙරණය ගොඩවල නැත. වැව් ඉස්මත්ත මුලුමනින්ම අනවසර අල්ලා ගැනීම් වලට ලක් වී ඇත.

වැව ඇතුලත පැහැදිලිව අනවසර කුඹුරු දක්නට ලැබේ



මෙම අනවසර ඉඩම් වලට තාවකාලික අනවසර බලපත්‍ර හෝ ඔප්පු නිතුත්කර ඇත. වැව ඉස්මත්ත පදිංචිය සදහා භාවිතා කිරීමත් නොයෙකුත් අක්‍රමිකතා සදහා භාවිතා කරමින් වැව ගොඩකරන ගොවීන් ඇත. උදාහරණ පනාදරගම වැව ඉසමත්තේ පදිංචිකරු වැව ගොඩකර විශාල හානියක් කර ඇත. මෙම තොරතුරු පරීක්ෂාවේදී හා ක්ෂේත්‍ර පරීක්ෂාවලදී දක්නට හා සහභාගී වු ගොවීන්ගෙන් ලැබුණු තොරතුරු අනුව වැව් ඉස්මත්තේ වන වැව තුලට පැමින අක්කර ගනන් අල්ලාගෙන වගා කරන අනවසර කරුවන් සංවිධානාත්මකව හා උපායශීලීව වාන පහත් කර වැව් තුල ඇති කුඹුරු ඉඩම් වල වී වගාව ජලයෙන් බේරා ගැනීමට කටයුතු කර ඇත.



දේශගණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ මෙම වැව් පද්ධති පුණරුත්ථාපනය කල ද වර්ථමානය වන විට වැව් හා අදාල පද්ධතිය සම්පූර්ණයෙන් ම වල් බිහි වී ඇත. ඊට අදාල වැව් මානා ඉලුක් හා වෙනත් ශාන වලින් කැලෑවට යට වී ඇත. මුලු පරිසර පද්ධතියම මේ නිසා වල් බිහිවී ඇති අතර වන අලින්ට මෙය කදිම තෝතැන්නකි. වාරිමාර්ග පරිසර පද්ධතිය නඩත්තු කර ගැනීමට ගොවි සංවිධානවලට අවශ්‍යතාවයක් හෝ හැකියාවක් නොමැති බව මෙයින් පෙනේ. විශාල වියදමක් දරමින් කර ඇති අලුත්වැඩියාවන් ඉතා කෙටිකලකින් විනාශ වී යා හැකිය.

ගම තුල නිරන්තරයෙන් ගොඩනැගිලි ඉදිවෙමින් පවතී වෘක්ෂලතා ආවරණය පවතින්නේ 15% පමණ වේ. වන සංරක්ණ දෙපාර්තමේන්තුවට අයත් වන සංරක්ෂණ කලාප සුලු වශයෙන් පැවතියද අනවසර දැව කැපීම් බහුල බව පරිසර අධ්‍යනයේදී ගම්යොා විය. මෙම එල්ලංගාව තුල මීට වසර 03කට පෙර පැවති මුලු ජනගහනය 927ක් පමණ විය. ක්‍රමයෙන් සිදු වන මෙම ජනගහන වර්ධනයත් සමග එල්ලංගාව තුල




තවතවත් වෙනස් භූමි දර්ශනයන් ඇති විය හැකිය. බොහෝ ඉඩම් එලිපෙහෙලි කිරීමත් සමග මැඩිල්ල අමුණ එල්ලංගාව අක්‍රීය වනු ඇත මෙම තත්වය පාලනය කර ගැනීමට එල්ලංගා කළමනාකරණ කමිටුවටත් ගොවීන් හා අකනෙකුත්ත් ප්‍රතිලාබීන්ගේත් සහයෝගය අත්‍යාවශ්‍යවේ. සතුන්ගෙන් සිදුවන හානිය (රිළවුන් අලින් මොණරුන් හා ඌරන්) ඉතා විශාලය. මේ නිසාම ගොවීන් වෘක්ෂ ලතා සිටුවීම සම්බන්ධයෙන් දක්වන්නේ අකමැත්තකි. රිළවුන් මොණරුන් හා අලින්ගේ ගැවසීම නිසා ගස් හා පදුරු කපා දැමීමට ගොවීන් පෙලඹී ඇත. ඌරන් හා මුවන් දඩයම් කිරීම ද දැකිය හැකිය.

## 3. එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතලය. මේ සඳහා විසඳුමක් වශයෙන් අලිවැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. සෑම වගා ඉඩමකම ගස් උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ඇත. වගා බිම් හා බොහෝ අවදානම් ස්ථානවල අලිවැට ඉදිකර ඇතත් මේවා විධිමත්ව ඉදිකරන ලද වැටවල් නොවේ. අනතුරුදායක වැටවල් ඒ අතර ඇතෙ. එල්ලංගාව මුලුමනින් ම පාහේ ජනාවාස වලින් යුක්ත වන හෙයින් නිරන්තරායන් නිවාස ඉදිකරමින් හා වැඩිදියුණු කිරීම් පවතී. තවද ඉඩම් කැබලිවීම ද වේගවත්ය. ගොඩ ඉඩම්වල සිදුවන පාංශු තට්ටුව කැපීම ළිං කැපීම හා විවිධ වගාවන්ට බිම් සැකසීම නිසා විශේෂෙයන් මහ කන්නයේ හා හදිසියේ ඇති වන සංවහන වර්ෂාව සිදුවන අවස්ථාවලදී වේගවත්ව ජලය ගලායාමත් සමග පාංශු ඛාදනයක් ඇතිවේ. මෙම ඛාදනයත් සමග රොන්මඩ හා පාංශු කොටස් වැව්වල තැම්පත්වීම වැලැක්විය නොහැකිය. අවිධිමත් වගාබිම් ව්‍යාප්තිය එල්ලංගාව තුල දක්නට ඇත. වැව් ඉස්මත්තේ හේන් වගාවද එල්ලංගාවට අහිතකර ලෙස බලපාන්නාවූ තවත් සාදකයකි. මෙහිදී විධිමත් පාංශු සංරකෂණ ක්‍රම අනුගමනය කලයුතුය.




කොන්ත්‍රාත් කරුවන්ගේ අවිචාරමත් ක්‍රම එල්ලංගාවට ඉතා දැඩි බලපෑමක් කර ඇති බව ගොවීහු පවසති. පුණරුත්ථාපන කටයුතු සමග ගමට ගිය කොන්ත්‍රාත් කරුවන් හා හිතවත් කම් හෝ සේවා සපයමින් අණවසර හෝ වෙනත් රක්ෂිත ඉඩම් තහවුරු කර ගැනීමේ අපේක්ෂාවෙන් සිටි කූට පුද්ගලයන් වැව් වාන් පහත් කරගැනීමට හෝ වැවේ රොන්මඩ වැව් රක්ෂිතයට ගොඩදමා ගැනීම වැනි නීති විරෝධී ක්‍රියාවන් වල යෙදී ඇත.




### 3.1 මැඩිල්ල අමුණ එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය

එල්ලංගා පද්ධතිය තුල පිහිටි මුලු වැව් සංඛ්‍යාව 10 කි. වැව් 4ක පුනරුත්ථපන කටයුතු 90%ක් අවසන්ය. මීට අමතරව තවත් වැව් 03ක් පුණරුත්ථාපනය කිරීමට සැලසම් සකස් කරමින් පවතී. මින් වැව් 03ක් අතීතයේ ඔලගම් වැව් වශයෙන් පවතින්නට ඇති බවට හදුනාගත හැකි ය. මෙම වැව් යටතේ ඇති කුඹුරු අක් 03 සිට අක් 72 දක්වා පරාසයක් පුරා පවතී යි. නෙලුම්පත්වැව යටතේ අක්කර 72ක් කුඹුරු වගා කරයි. පහත වගු සටහන අනුව මැඩිල්ල අමුණ නමින් වැවක් දක්නට නැත. එහෙත් එල්ලංගාවේ ජලය අවසාන වශයෙන් ගලා යන්නේ මැඩිල්ල අමුණටයි. මෙම අමුණෙන් කුඹුරු අක්කර 42ක් පමණ පෝෂණය කිරීමෙන් පසු එල්ලංගාවේ ජලය ඉගිනිමිටිය ජලාශයට ගලා යයි. එල්ලංගාවේ ජල කළමනාකරණය පිළිබදව සැලකිල්ලට ගැනීමේ දී මෙම වැව් පිළිබදව වැදගත් කමක් ඇත. විශේෂයෙන්ම වැව් 04 ක හැර සෙසු වැව් වල සැලකියයුතු ගොවීන් සංඛ්‍යාවක් ඇත එය නඩත්තුවට පහසුය. එහෙත් මෙම වැව් වල නඩත්තුව ඉතා දුර්වල බව සදහන් කල යුතුය. ඇලවේලි හා වැව් බැම්මේ නඩත්තුව වසරකට වරක්වත් නිසි පරිදි සිදුනොවේ. මෙයට හේතුව වන්නේ වැව යටතේ වගා කන්නයට පමනක් නඩත්තු කිරීමයි. එක් ගොවි

සංවිධානයකට වැව් කිහිපයක් කළමනාකරණය කිරීමට සිදුවී ඇත. මෙම තත්වය නඩත්තුව දුර්වල වීමට හේතුවේ. ගොවි සංවිධානයේ ක්‍රියාකාරී තත්වය හා නීති රීති ද නඩත්තුව දුර්වල වීමට හේතුවේ. මෙම පද්ධතිය තුල පවතින ගොවි සංවිධානයේ තනතරු බෙදීයාමේදී පවතින විශමතාවය මෙයට බලපා ඇත. තවද මෙයට එල්ලංගාවේ පවතින තත්වය සෘජුවම බලපාන ලබයි. (රැලි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය. ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්ථිර බෝග වගාවන්ගෙන් ව්‍යාප්ත වී ඇත බෙහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලෙනි. මෙම වැව් තාවුල්ල හා බැදුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත.) ජල පාලක වරුන් සෑම වසරකම අලුතෙන් පත් කරන්නේ කන්න රැස්වීමේදීය. ඇතැම් ජල පාලකයන් එක දිගටම කිහිපවරක් පත්වෙන්නේ ගොවීනන්ගේ කැමැත්තෙනි. ගොවි සංවිධාන රැස්වීම් වල සනපූරණය පිලිබදව ගැටලු ඇත. පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුව ගොවි සංවිධානය මගින් සිදු කරනු ලබන අතර නඩත්තුව ගොවීන් වෙත පංගු ලැස්තුවට අනුව බෙදා ඇත. මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලකක වෙත සලාරිස් ලැබිය යුතු වුවත් එවැන්නක් ක්‍රියාත්මක නොවේ. මෙය අදාල කාර්යය පිලිබදව වගකීමක් නොගැනීමට හේතුවේ. වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්භ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ බෙත්මට වී වගා කෙරේ . මෙය වගා ක්‍රමය ගොවීන් වගා කටයුතු පිළිබදව දුර්වල කරන්නාවූ ක්‍රමයකි. වී වගා නොකරන ඉඩම් වල මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාවක් සිදු කරනු නොලබයි. මේ හේතුවෙන් මෙහෙයුම් හා නඩත්තුව සම්බන්ධයෙන් ගොවි සහභාගිත්වයේ විශේෂ දුර්වල බවක් පෙන්වයි. තවද මෙහෙයුම් හා නඩත්තුවපිළිබදව සැලසුමක් හෝ අරමුදලක් පවත්වාගෙන යන බවක් නොපෙනේ. තවද අරමුදල් වර්ධනය වීමක් ද නැත. සංවිධාන වල ඇත්තේ ඉතා සුළු අරමුදලකි. මෙය පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුවට පවතින ප්‍රබල බලපෑමකි. තවද කන්න රැස්වීම හා පංගු ලැයිස්තු අනුව එම තීන්දු තීරණ පැහැර හරින ගොවීන්ට විරුද්දව නීතිමය පියවර නොගැනීමත් මෙහිදී සැලකිල්ලට ගත යුතුය.

**එල්ලංගාවේ ගොවි සංවිධාන**

| අංක | වැවේ නම | ගොවීන් සංඛ්‍යාව | අක්කර | ගොවි සංවිධානය | පුණරුත්ථාපනය |
|---|---|---|---|---|---|
| 01 | අටවරළ වැව | 51 | 38 | | පුණරුත්ථාපනය කලා |
| 02 | විමලදාසගේ වැවන | 4 | 5 | | පුණරුත්ථාපනය කලා |
| 03 | ජයවීරගේ වැව | 07 | 06 | | පුණරුත්ථාපනය කලා |
| 04 | තරණගස් වැව | 58 | 21 | | පුණරුත්ථාපනය කලා |
| 05 | කැප්පෙටියාව වැව | 10 | 10 | | පුණරුත්ථාපනය නැත |
| 06 | පත්තිනිගම වැව | 09 | 05 | | පුණරුත්ථාපනය නැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| 07 | සුද්දනාගේ වැව | 05 | 04 | | පුණරුත්ථාපනය නැත |
| 08 | නෙලුම්පත් වැව | 81 | 72 | පබද ගොවි සංවිධානය | |
| 09 | නැලැව මහ වැව | 36 | 32 | පැරකම් ගොවි සංවිධානය | |
| 10 | නැලැව කුඩා වැව | 9 | 8 | | පුණරුත්ථාපනයනැත |

මූලාශ්‍රය ගොවි ජන සං. දෙ .නවගත්තේගම

වගුව 10

ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය

| | Average Monthly Rainfall (mm) | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Month | Anamaduwa Dispensary | Atharagalla | Dewahuwa | Giribawa | Inginimitiya | Karandipooval | Kottukachchiya | Maha Uswewa | Mahagalkadawala | Mediyawa Tank | Puttalam | Siyambalangamuwa | Tabbowa Irrigation |
| Jan | 46 | 48 | 124 | 49 | 68 | 44 | 36 | 44 | 72 | 85 | 49 | 58 | 49 |
| Feb | 35 | 30 | 96 | 35 | 46 | 40 | 32 | 34 | 49 | 52 | 40 | 51 | 35 |
| Mar | 84 | 61 | 73 | 45 | 64 | 57 | 83 | 61 | 72 | 104 | 54 | 50 | 70 |
| Apr | 176 | 153 | 176 | 123 | 196 | 120 | 167 | 151 | 199 | 214 | 136 | 152 | 151 |
| May | 122 | 82 | 85 | 70 | 79 | 91 | 114 | 86 | 86 | 105 | 94 | 65 | 106 |
| Jun | 47 | 17 | 29 | 13 | 19 | 25 | 47 | 18 | 17 | 39 | 27 | 12 | 34 |
| Jul | 21 | 9 | 21 | 8 | 18 | 13 | 25 | 10 | 20 | 22 | 10 | 16 | 17 |
| Aug | 35 | 27 | 27 | 21 | 29 | 15 | 33 | 26 | 35 | 37 | 20 | 26 | 30 |
| Sep | 71 | 56 | 64 | 57 | 74 | 57 | 60 | 52 | 84 | 77 | 68 | 62 | 62 |
| Oct | 269 | 233 | 280 | 192 | 233 | 227 | 262 | 221 | 239 | 297 | 241 | 227 | 234 |
| Nov | 225 | 235 | 288 | 174 | 225 | 219 | 238 | 225 | 241 | 265 | 238 | 231 | 202 |
| Dec | 129 | 140 | 258 | 122 | 158 | 131 | 118 | 138 | 165 | 176 | 136 | 142 | 116 |

ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය ඉහත වගුව තුලින් දක්වා ඇත. මෙම සටහන් අනුව එල්ලංගාව ආසන්නයේම ගිරිබාව අතරගල්ල හා ඉඟිනිමිටිය වැසි මාන තොරතුරු අනුව ඉතා අවම වර්ෂාපතනයක් මෙම වසර තුල දක්කවා ඇත. දැනට එල්ලංගාවේ පිහිටි සෑම වැවකම ජලය බෙදා දීම මුර ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර ඒ අනුව එක් එක් ගොවියාට පැය කිහිපයක් පමණක් ජලය ලබාදේ. ඇල පද්ධතියේ දුර්වලතා දක්නට ඇත. මේ නිසා ජල කලමනාකරණයක් කල නොහැක. එහෙත් ඇතැම් ගොවීන් තම


අභිප්‍රාය අනුව ජලය ලබාගැනීම නිසා විධිමත් ජල පාලනයක් සිදු නොවේ. සියලුම වැව්වල වගා කටයුතු අඛණ්ඩව සිදු නොකරන බැවින් ඒවායේ ක්‍රියාකාරීත්වය ද දුර්වල වී ඇත. විශේෂයෙන්ම වගා කරන කන්න වල පමණක් ගොවි සංවිධාන ක්‍රියාත්මක වන අතර බොහෝ ගොවි සංවිධාන නිලධාරීන්ට පමණක් සීමා වී ඇත. විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර වගා කරන කන්න වල පමණක් ඇළවල් සුද්දවේ. මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී ඇත. එහෙත් කන්න රැස්වීමේ නීතිරීති අනුව නඩත්තු කටයුතු ඉටුවන බව නිලධාරින් පවසති. ඇල පද්ධතිය ඉතා අබලන්ය. මේ නිසා යම් ක්‍රමානුකූල ජල කළමනාකරණයක් සිදු කල නොහැකිය. ඇතැම් ඇලමාර්ග කුණු ඇලට ජලය හරවා කුණු ඇල පුරවා කුඹුරු වලට ජලය හරවා ගැනීමට ගොවීන් කටයුතු කරයි. ඒ අනුව ජල කළමනාකරණයක් පිළිබඳව කථා කිරීමට පෙර පද්ධතිය නිසි පරිදි අලුත්වැඩියා කලයුතුය.

## 3.2 සමාජ ආර්ථික තොරතුරු

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුරාණ **යාපහුව රාජධානියට** ආසන්නව පිහිටා ඇති අතර ඓතිහාසික සාධක මත අනුරාධපුර යුගයේදී මෙම ප්‍රදේශයේ ජනාවාස ආරම්භ වූ බව සැලකේ. පීල්ල රාජකීය විහාරය, වෙහෙරලන්දයාය, සඳුන්ගිරි රාජකීය විහාරය, ඇඹුල්ගිරි රාජකීය විහාරය, ගනේගම රාජකීය විහාරය සහ ගවරතිස්සරාමය දේවාලය ඇතුළු පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථාන රාශියක් මැඩිල්ල අමුණ ආසන්නයෙන්ම පිහිටා ඇත .

අනුරාධපුර සහ කුරුණෑගල යන ප්‍රධාන නගර දෙකක් අතර මධ්‍යමස්ථානය වූ බැවින් පුරාණයේ සංචාරකයින / වෙළෙන්දන් සඳහා විවේක ස්ථානයක් වන අම්බලම (වර්තමාන අඹන්පොල බස් නැවතුම්පොළේ) පිහිටියේ අඹන්පොල නගරයේය. මේ අනුව අඹන්පොළ යන වර්තමාන ස්ථාන නාමය 'අම්බලන්පොළ' යන්නෙන් ව්‍යුත්පන්න වී ඇති බව පැරණි මුතුන්මිත්තන්ගේ සාක්ෂිවල සඳහන් වේ. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 1988 දී මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උප කාර්යාලයක් ලෙස ආරම්භ කරන ලද අතර 2000 වර්ෂයේදී නව ලේකම් කාර්යාල ගොඩනැගිල්ලක් විවෘත කිරීමත් සමඟ පූර්ණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස ක්‍රියාත්මක විය. ගොවිජන සේවා කටයුතු සඳහා අඹන්පොල ගොවිජන සේවා මධ්‍යස්ථානය ක්‍රියාත්මකවේ. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වැව් 28ක් සහ අඹකොළවැව සහ මැඩියාව යන ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම දෙකක් සහ සුළු වාරි වැව් 283 ක් ඇත. එල්ලංගාව තුල ජීවත්වන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 972කි. පවුල් වශයෙන් 162 කි. මෙම ජනගහනයෙන් 85% කෘෂිකර්මාන්තය හා ආශ්‍රිත රැකියාවන්හි නිරතවේ. පහත ප්‍රස්ථාරයෙන් ඒඒ එල්ලංගා අනුව ප්‍රතිලාභී ව්‍යාප්තිය පැහැදිලි කරයි.


රූපය 3.16 අඹන්පොළ හොට්ස්පොට් කැස්කැඩ් පාදක ව්‍යාපෘති ප්‍රතිලාභීන්




| පවුලේ ආදායම් | පවුල් ගණන |
|---|---|
| 1000 -8000 | 344 |
| 8001- 15000 | 595 |
| 15001 -20000 | 688 |
| | |
| 20001- 25000 | 971 |
| 25001- 30000 | 378 |
| 300000< | 155 |
| මුළු | 3131 |

PRA - CSIAP

PRA - CSIAP




අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය ම ආවරණය වන පරිදි ආදායම් මට්ටම සලකා බැලීමේදී ඉහත වගු සටහන හා ප්‍රස්ථාරය අවධානය යොමු කරමි. මැඩිල්ල අමුණ එල්ලංගාව හා ඊට අදාල ප්‍රජාවගේ ආදායම් තත්වය ද සැලකිල්ලට ගත යුතුය. ප්‍රාදේශීය ජනගහනයෙන් 31%කගේ ආදායම 20001- 250000 කි. ජනගහනයෙන් 22%ක ගේ ආදායම වන්නේ 150001 -20 000 අතර වේ. මේ අනුව ජනගහනයෙන් හරි අඩකඩට වැඩි ප්‍රමාණයක ඇත්තේ 150001 – 25000 අතර ආදායමකි. 300000 වැඩි ආදායමක් ලබන්නේ 5% වැනි සුළු ප්‍රමාණයකි.

පිටුව | 28 වගුව 5.3 අබන්පොල උණුසුම් කලාපය පවතින වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන්


| අංක | එල්ලංගාව | මහ ඉඩම් | යල ඉඩම් | [illegible] | [illegible] |
|---|---|---|---|---|---|
| 1 | කට්ටපුව | **111** | **45** | **301** | **120** |
| 2 | දත්තව මහවැව | **68** | **27** | **184** | **73** |
| 3 | මැඩිල්ලඅමුණ | **138** | **55** | **373** | **149** |

PRA - CSIAP

කෘෂිකර්මාන්තය ප්‍රධාන කොටගත් ආදායම ඉහත වගු සටහනින් දක්වයි. මැඩිල්ල අමුණමහ කන්නයේ හෙක් 138ක් වගාකර ලබාගන්නා ආදායයම මෙ ටො 373කි. මෙලෙසය යල් කන්නයේදී එල්ලංගාව තුල වී අස්වැන්න හෙක් 55 කට මෙ ටො 149 දක්වා පහල බසී. මෙම තත්වය සලකා බැලීමේදී වාර්ෂික ආදායම මෙලෙස හැසිරීම සාධාරණ විය හැකිය. මේ අනුව ගොවීන්ගේ වාර්ශික ආදායම අඩුවීමට හේතුවේ. තවද පහත සඳහන් වගුව අනුව මැඩිල්ල අමුණ එල්ලංගාවේ බඩඉරිගු වගාවේ අස්සැන්න හා වගා තත්වයන් දක්වා ඇත. මේ අනුව හෙ 28-35 දක්වා වන වාර්ශික වගා.වේ අස්වැන්න මෙ ටො 83 -104 දක්වා අගයක් ගනී. (මහ හා යල වගා කන්නයෙනි) වෙනත් ආදායම් මාර්ග පවතින්නේ ඉතා සුලු වශයෙනි.

එල්ලංගාව තුල ජීවත්වන ශ්‍රමිකයන් 10% පමණ කම්කරුවන් වශයෙන් ප්‍රදේශයේ ම හා ආසන්න තඹුත්තේගම අඹන්පොල හා ගල්ගමුව උප නගරවල සේවය කරයි. තවද තොග විශේෂයෙන් එළවළු හා පලතුරු රැස් කරමින් මෙම නගරවලට අළෙවි කරන තොග වෙළෙන්දන්කිහිපදෙනෙකුද එල්ලංගාව තුල ව්‍යාපාර කටයුතු වල නිරතව සිටී.

අඹන්පොල ප්‍රදේශීය ලේකම් බල ප්‍රදේශයේ වී වගා ව්‍යාප්තිය




PRA - CSIAP

වගුව 5.5 – HSAADP ව්‍යාපෘතියෙන් පසු මුළු එල්ලංගාවේ පාදක වැඩිවීමේ පුරෝකථනය වී නිෂ්පාදනය

| අංකය | එල්ලංගාව | පවතින වී නිෂ්පාදනය Mt | | HSAADP පසු පුරෝකථනය කළ නිෂ්පාදනය | |
|---|---|---|---|---|---|
| | | මහ Mt | යල Mt | මහ Mt | යල Mt |
| 1 | කට්ටපුව | 301 | 120 | 361 | 216 |
| 2 | දත්තව මහවැව | 184 | 73 | 221 | 131 |
| 3 | මැඩිල්ලඅමුණ | 373 | 149 | 448 | 268 |
| 4 | පිදුරුවල්ලව වැව | 512 | 205 | 614 | 369 |

වගුව 5.7 අඹන්පොල උණුසුම් කලාප එල්ලංගා පදනම පවතින බඩ ඉරිඟු වගා තත්ත්වය

| අංක | එල්ලංගාව | මහ ඉඩම් දිගුව | නිෂ්පාදන Mt | යල ඉඩම් දිගුව | නිෂ්පාදන Mt |
|---|---|---|---|---|---|
| 1 | කට්ටපුව | 22 | 67 | 28 | 84 |
| 2 | දත්තව මහවැව | 14 | 41 | 17 | 51 |
| 3 | මැඩිල්ලඅමුණ | 28 | 83 | 35 | 104 |
| 4 | මාමුණුගම | 3 | 10 | 4 | 13 |

PRA - CSIAP

වගුව **5.9** අබන්පොල උණුසුම් ස්ථාන එල්ලංගා පදනම පවතින වාර්ෂික රටකජු නිෂ්පාදන තත්ත්වය

| අංකය | එල්ලංගාව | යල ඉඩම් දිගුව **Ha** | වාර්ෂික නිෂ්පාදන **Mt** |
|---|---|---|---|
| 1 | කට්ටපුව | 33 | 57 |
| 2 | දත්තව මහවැව | 20 | 35 |
| 3 | මැඩිල්ලඅමුණ | 41 | 70 |
| 4 | මාමුණුගම | 57 | 97 |

PRA - CSIAP

## 3.3 එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

ප්‍රෙද්ශයේ කෘෂිකාර්මික බෝග රටාව ලෙස මහ කන්නය වැසි ජලය උපයෝගී කරගෙන යල කන්න වැව් හා කෘෂි ළිංවල ජලය කළමනාකරනය කරමින් සිදු කරයි . යල කන්නයේ දී ද වී වගාව සිදු කරන අතර හේන් වගාවද සිදු කරයි. යල කන්නයේ දී කැප්පෙටියාව වැව පත්තිනිගම වැවහාසුද්දනාගේ වැවනැලැව මහ වැවයනවැව් ආශ්‍රිතව බෙත්ම ක්‍රමයට වගා කටයුතු සිදු කරන අතර බොහෝ විට අතිරේක බෝග වගාව ද සිදු කරයි.

**වගුව 3 .2 අඹන්පොළ තෝරාගත් එල්ලංගා පාදක ඉඩම් භාවිත පැතිකඩ**

| අනු අංකය | එල්ලංගාව | වැව් ගණන | ආවරණය කරන ලද වැව් ප්‍රදේශය (හෙක්ටයා) | කෘෂිකාර්මික ඉඩම් වර්ගය හෙක්ටයාර | |
|---|---|---|---|---|---|
| | | | | අඩු | වැඩි |
| **1** | කට්ටපුව | 12 | 111 | 162 | 173 |
| **2** | දත්තව මහවැව | 5 | 68 | 99 | 105 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **3** | මැඩිල්ලඅමුණ | 9 | 138 | 200 | 214 |
| **4** | මාමුණුගම | 27 | 190 | 275 | 294 |

PRA - CSIAP

එල්ලංගාවට අයත් මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 414ක් ගොඩ හා මඩ ඉඩම් ලෙස වගා කටයුතු කරනු ලබයි. මෙයින් මහ කන්නයේ දී හෙක්ටයාර 373ක් හා යල කන්නයේ දී හෙක්ටයාර් 149ක් වී වගා කරන අතර එයින් මහ කන්නයේ දී වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 446ක් ද යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 268ක් ද වේ. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් වැව් ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව මෙම නිෂ්පාදනය අගයන්ද මෙම අගයන්ම බව PRA (ඉහත වගු සටහන් අනුව) වාර්ථාවේ සදහන් වේ. මේ අනුව එල්ලංගාව දැනටමත් අස්වැන්න යම් ස්ථාවර මට්ටමකට පැමිණ ඇතැයි සදහන් කල හැකිය. වෙනත් අතිරේක භෝග වශයෙන් රට කජු, ලොකු ළූණු, මුං, කව්පි හා පළතුරු ලෙස කෙසෙල්, පැණිකොමඩු අදිය ද වගා කරයි. ඊට අමතරව පොල් හා තේක්ක දැව වගාවද ප්‍රෙද්ශය පුරා දක්නට ලැබේ. දැව ලෙස තේක්ක අළවියෙන් යම් ආදායමක් ලබාගනී. මැඩිල්ල අමුණ එල්ලංගාව යටතේ බඩඉරිඟු නිෂ්පාදිත බිම් මහ සහ යල ලෙස පිලිවෙළින් හෙක්ටයාර 28 සහ 35 ලෙස ද බඩ ඉරිඟු නිෂ්පාදනය මහ සහ යල පිළිවෙලින් මෙට්‍රික්ටොන් 83 හා 104 ලෙසද හඳුනාගැනේ. මෙම වගාවට ගොවීන් වැඩිපුර නැඹුරු කරගැනීමේ හැකියාවක් පවතී. තවද වාර්ශික රට කජු වගාව හෙක් 41 පමණ වන අතර අස්වැන්න 70 මෙ ටො පමණ වේ. පැනිකොමඩු නිෂ්පාදනය ද සැලකිය යුතු මට්ටමකින් සිදු කරන අතර හෙක්ටයාර 12කින් මෙට්‍රික්ටොන් 84ක් පමණ අස්වැන්නක් ලබා ගෙන ඇත. මීට අමතරව අක්කර 47ක පමණ පොල් වගාවද දක්නට ලැබේ. විශේෂයෙන් වැව් ආශ්‍රිතව පොල් වගාව බහුලව දැකගත හැකිය. ඉන් 40%ක් පමණ එල නොදරන පැල පොල් වගාව ලෙස පවතී. අලින්ගෙන් අති විශාල හානියක් පොල් වගාවට සිදුවේ. මෙම වගාව රැකගැනීමට ගෙවීන් දැඩි පරිශ්‍රමයක් දරයි . මේ සඳහා ඉඩම් වටා අක්‍රමවත් අලිවැට යොදාඇත. මෙම ප්‍රදේශයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් අතිරේක ආහාර බෝග වගාව සඳහා රටකජු, තල, මිරිස්, කව්පි වැනි බෝග ගොවීන්ට වගාව සඳහා ලබා දී ඇත. තවද සූක්ෂම බින්දු ජල වාහන පද්ධති, කෘමි ප්‍රතිරෝදක දැල්, කෘෂි ලිං, සූර්යය බලයෙන් යුත් ජල පොම්ප, වගා ආවරණ දැල්, කාපට් නිෂ්පාදන සමිති මගින් ලබාදී ඇත. ගොවීන් සඳහා කෘෂිකාර්මික දැනුම ලබාදීමටද ව්‍යාපෘතිය කටයුතු කර ඇත. පහත වගුවෙන් අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉඩම් පරිහරණ වගා රටාව දක්වා ඇත.

**වගුව 3.1 – අබන්පොල DSC හි ඉඩම් පරිහරණ ව්‍යාප්තිය**

| ඉඩම් පරිහරණ වර්ගය | ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|
| ප්‍රධාන වගාවන් (පොල්) | 83.3 |
| වෙනත් ස්ථිර භෝග | 46.82 |
| වී | 3401.42 |
| වෙනත් වාර්ෂික භෝග (ගෙවතු) | 1603.15 |
| ජල මූලාශ්‍ර (ටැංකි, ජලාශ, වාරිමාර්ග යෝජනා ක්‍රම, ගංගා) | 1706.55 |
| ක්‍රවුන් ලෑන්ඩ් | 7918.00 |
| බැරන් ඉඩම / වගුරු බිම | 8.92 |
| සොහොන් බිම / පොදු භාවිතය | - |

| | |
|---|---|
| වනාන්තර ඉඩම | - |
| ලඳු කැලෑව | 1162.72 |
| වෙනත් පාෂාණමය ඉඩම | 10.84 |
| එකතුව | **15,941.72** |

මූලාශ්‍රය: අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ, 2018

## 4 එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

මැඩිල්ල අමුණ එල්ලංගාවේ පැවති හරස්කඩ චාරිකාවේ දී මෙන්ම ගොවි සංවිධාන හා නිලධාරීන් සමග පැවති සාකච්ඡා අනුව එල්ලංගාව මුහුණදෙන ප්‍රධන අභියෝග ගැටළු පිළිබඳව අවධාරණය කරගත හැකි විය. එල්ලංගා හරස්කඩ චාරිකාවෙන් පසු ගොවි සංවිධාන හා එහි සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේදී පහත සඳහන් පොදු ගැටළු හඳුනාගත හැකි විය. මෙසේ හදුනාගත් ගැටලු ගොවින් ගේ අදහස අනුව ප්‍රමුඛතාගත කිරීමක්ද කල අතර ඒ අනුව පහත සඳහන් ගැටලු ලේඛණය ගොනුකර ඇත. තවද උපාය මාර්ගික මැදිහත්වීම් හා මැදිහත්විය යත ආයතන පිළිබදව තක්සේරුවක් කර දළ ඇස්තමේන්තවක් සකස් කර කාල රාමුවක්ද අමුණා ඇත. මෙම වාර්ථාව එල්ලංගා කළමනාකරණ කමිටවට ඉදිරිපත් කර සාකච්ජා කර ක්‍රියාවට නැංවිය යුතුය. මෙම සැලැස්ම ක්‍රියාවට නැංවීමට ගොවිජන සංවර්දන දෙපාර්තමේන්තුව හා ගොවි සංවිධානමුළිකත්වය ගතයුතුවේ. එමෙන්ම එල්ලංගා කළමනාකරණ කමිටුවේ මූලිකත්වය ද ප්‍රධානවේ.

## 4.1 උග්‍ර ගැටළු විසඳීම/ අවම කිරීම සඳහා යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම් මැඩිල්ල එල්ලංගාව

| අනු අංක | උග්‍ර ගැටළු | යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම් | මැදිහත්විය යත ආයතන |
|---|---|---|---|
| 1 | මෙම වැව් වල ජලය වගාවට ප්‍රමාණවත් නැත. (වාන පහත් කරලා)<br><br>පනාදරගම වැව<br>කුඩා වැව | I. කොන්ත්‍රාත් කරුන්වන් පාර්ශව කරුන්වන් හා ව්‍යාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම.<br>II. රුඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම. | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ<br>5. කෘ දෙ |
| 2 | කට්ටකඩුව හා පෙරණය නැත.<br>(පනාදරගමවැව කුඩා වැව. තම්මැන්නාව අංකිරිප්පව ) | I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම.<br>II. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම.<br>III. කට්ට කඩුව නිරීක්ෂණය කර එකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ට කඩුව වෙන් කිරීම. | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ |

| | | | |
|---|---|---|---|
| | | IV. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සඳහා පැල සිටුවීම . | |
| 3 | රක්ෂිත අල්ලාගෙන ඇත (පනාදරගමවැව කුඩාවැව තම්මැන්නාව ඉහල වැව ) | I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හඳුනා ගැනීම<br>II. ඒකාබද්ධ සැලසුමක් සකස් කිරීම<br>III. වැව් මැන සළකුණු කිරීම<br>IV. අණවසර කරුන්වන් ඉවත් කිරීම | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ<br>5. ප්‍රාදේශීය ලේකම් |
| 4 | ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම . ( කුඹුරු විනාශවී ඇත පනාදරගම .) | I. කොන්ත්‍රාත්කරුන්වන් පාර්ෂවකරුන්වන් භාවයාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම .<br>II. අදාල ස්ථාන හා ගොවීන් හඳුනා ගැනීම.<br>III. ඇස්තමේන්ත සකස් කිරීම හා ප්‍රතිපාදන සපයා ගැනීම<br>IV. කොන්ත්‍රාත් ගොවි සංවිධානයට පැවරීම හා ප්‍රගතිය පරීක්ෂාව . | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ |
| 5 | පුණරු ත්ථාපණයේදී වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවක සේදී වැවට එකත වී වැව ගොඩවීම.<br><br>(wä 4 muK උස È. óg¾ 300 පමණ) mkdor.u | I. කොන්ත්‍රාත්කරුන්වන්පාර්ෂව කරුන්වන් භාවයාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම .<br>II. රුඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම . | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ |
| | | | |

| | | | |
|---|---|---|---|
| 6 | කෘෂි පාර නැත (කට්ටකඩුව සිට අංකිරිප්පව දක්වා මී 500 හා පකාදරගම වානේ සිට කුඹුරු දක්වා කෘෂිපාර නැත. (මී 750) | I. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම<br>II. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා ඇස්තමේන්තුවක් ලබාගැනීම<br>III. ප්‍රතිපාදන සපයා ගැනීම<br>IV. ගොවි සංවිධානය මගින් අලුවැඩියා කිරීම | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග |
| 7 | අංකිරිප්පුව වාවේ පැවති වේල්ල කොන්ත්‍රාත්කරු ඉවත් නරලා අක් 01ට ජලය ගන්න බෑ | I. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම<br>II. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා කොන්ත්‍රාත් කරුවන් මගින් නැවත ඉදිකිරීම | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ |

| | | | |
|---|---|---|---|
| 8 | වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත නඩත්ත ඉතා දර්වලයි | I. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම<br>II. නඩත්ත සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග |
| 9 | ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම. | I. CMC හිදී සාකච්ජා කිරීම.<br>II. අදාල වැව් හදුනා ගැනීම.<br>III. කෘ දෙ උපදෙස් ලබාගැනීම<br>IV. ඇස්තමේත්තු කිරීම<br>V. සුදුසු කෘමිනාෂකයක් යෙදීම | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ<br>5. කෘ දෙ |

**4.2 උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හා දළ ඇස්තමේන්තුව**

**වගු අංක 11- උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් මැඩිල්ල**

| අනු අංක | උග්‍ර ගැටළු හා ගැටළුව පවතින ස්ථාන | දළ ඇස්තමේන්තුව (මිටර්) | යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම් | මැදිහත්වීම |
|---|---|---|---|---|
| 01 | වැවේ ජලය වගාවට ප්‍රමානවත් නැත.<br>(වාන පාහත්)<br><br>පනාදරගමවැව<br>කුඩා වැව | 0.3 | i. CMC හිදී අදාළ පාර්ශව සමග සාකච්ජා කිරීම.<br>ii. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම.<br>iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>iv. අවශ්‍ය නම් ප්‍රතිපාදන සපයා ගැනීම.<br>v. කොන්ත්‍රාත් ගො සං පැවරීම.<br>vi. අධීක්ෂණය. | 1ගොවි සංවිධාන<br>2CSIAP ව්‍යාපෘතිය<br>3.ගොවිජන සං දෙපා<br>4.පළාත් වාරිදෙපා<br>5 CMC |
| 02. | කට්ටකඩුව හා පෙරණය නැත.<br>(පනාදරගමවැව කුඩා වැව.<br>තම්මැන්නාව අංකිරිප්පව ) | 0.2 | i. CMC හිදී සාකච්ජාවට ගැනීම.<br>ii. අවශ්‍ය වැව් තෝරා ගැනීම .<br>iii. ගොවීන් දැනවත් කිරීම.<br>iv. ඒකාබද්ධව කට්ටකඩුව වෙන් කිරීම.<br>v. පැල සඳහා ප්‍රතිපාදන සපසා දීම.<br>vi. අධීක්ෂණය | 1.ගොවි සංවිධාන<br>2.CMC සහ CSIAP ව්‍යාපෘතිය<br>3.ගොවිජන සං දෙපා<br>4.පළාත් වාරිදෙපා |

| | | | | |
|---|---|---|---|---|
| 03. | රක්ෂිත අල්ලාගෙන ඇත.<br>පුද්ගලික පාරකට යොදාගෙන<br>(පනාදරගමවැව කුඩාවැව<br>තම්මැන්නාව ඉහල වැව _) | 0.3 | i. CMC හිදී සාකච්ඡා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම<br>ii. ඒකාබද්ධ සැලසුමක් සකස් කිරීම<br>iii. වැව් මැන සළකුණු කිරීම<br>iv. අනවසර කරුවන්ඉවත් කිරීම | 1.ගොවි සංවිධාන<br>2.CSIAP ව්‍යාපෘතිය<br>3.ගොවිජන සං දෙපා<br>4.පළාත් වාරිදෙපා<br>5. CMC |
| 04. | ඇල කඩාගෙන ගොස් ජලය<br>අපතේ යාම.( කුඹුරු විනාශවී ඇත පනාදරගම.) | 0.4 | i. පාර්ශව කරුවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග CMCහිදී සාකච්ජා කිරීම.<br>ii. අදාල ස්ථාන හදුනා ගැනීම.<br>iii. ඇස්තමේන්තු සකස් කිරීම හා ප්‍රතිපාදන සපයා ගැනීම.<br>iv. කොන්ත්‍රාත් ගොවි සංවිධානනයට පැවරීම හා ප්‍රගතිය පරීක්ෂාව. | 1. ගොවි සංවිධාන<br>2. CSIAP ව්‍යාපෘතිය<br>3.ගොවිජන සං දෙපා<br>4.පළාත් වාරිදෙපා<br>5. CMC |
| 05. | වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස්<br>නැවක සේදී වැවට එකත වී වැව ගොඩවීම<br>(wä 4 muKළස È. óg¾ 300<br>පමණ) mkdor.u | 0.3 | i. පාර්ශව කරුවන්හා ව්‍යාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම .<br>ii. ඇස්තමේන්තු සකස් කිරීම හා ප්‍රතිපාදන සපයා ගැනීම<br>iii. කොන්ත්‍රාත් ගොවි සංවිධානනයට පැවරීම හා ප්‍රගතිය පරීක්ෂාව. | 1. ගොවි සංවිධානකරුවන්<br>2.CMC සහ CSIAP ව්‍යාපෘතිය<br>3.ගොවිජන සං දෙපා<br>4.පළාත් වාරිදෙපා |

| | | | | |
|---|---|---|---|---|
| 06. | කෘෂි පාර නැත ( කට්ටකඩුව සිට අංකිරිප්පව දක්වි මී 500 හා පකාදරගම වානේ සිට කඹරු දක් වා කෘෂිපාර නැත<br>I. මී 750) | 0.7 | i. CMC හිදී සාකච්ජා කිරීම.<br>ii. ස්ථාන හදුනාගැනීම.<br>iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>iv. ඇස්තමේන්තු කිරීම හා කොන්ත්‍රාත් පැවරීම.<br>v. ප්‍රගතිය පරීක්ෂාව | 1. ගොවි සංවිධාන<br>2. CMC සහCSIAP ව්‍යාපෘතිය<br>3.ගොවිජන සං දෙපා<br>4.පළාත් වාරිදෙපා |
| 07. | අංකිරිප්පව වැවේ පැවති වේල්ල කොන්ත්‍රාත් කරු ඉවත් කරලා.<br>අක් 01 ට ජලය ගන්න බෑ | 0.2 | i. CMC හි දී සාකච්ජා කිරීම.<br>ii. ස්ථාන හදුනාගැනීම.<br>iii. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම.<br>iv. ඇස්තමේන්තු කිරීම හා කොන්ත්‍රාත් පැවරීම.<br>v. ප්‍රගතිය පරීක්ෂාව | 1. ගොවි සංවිධාන<br>2. CMC සහ CSIAP ව්‍යාපෘතිය<br>3.ගොවිජන සං දෙපා<br>4.පළාත් වාරිදෙපා |
| 08. | වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත නඩත්ත ඉතා දර්වලයි | 0.2 | i. CMC හිදී සාකච්ජාවට ගැනීම.<br>ii. නඩත්ත වැඩ හඳුනා ගැනීම.<br>iii. ප්‍රමාණ මැනීම් කටයුතු සිදු කිරීම.<br>iv. ගොවි සංවිධාන දැනුවත් කිරීම.<br>v. නඩත්තු සැලැස්මක් සකස් කර ගොවි සංවිධාන මගින් ක්‍රියාත්මක කිරීම. | 1. ගොවි සංවිධාන<br>2. CMC සහ CSIAP ව්‍යාපෘතිය<br>3.ගොවිජන සං . දෙපා.<br>4.පළාත් වාරි. දෙපා.<br>5. ප . කෘ. දෙ. |
| 09. | ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම.<br>ආක්‍රමණික ජලජ ශාක ජපන් ජබර,විල කටු | 0.2 | i. CMCහිදී සාකච්ජාවට ගැනීම.<br>ii. ඇස්තමේන්ත කිරීම.<br>iii. ජලය අඩුවීමත් සමග නිර්දේශිත කෘමි. නාශකයක් යෙදීම.<br>iv. පවත්වාගෙන යාම. | 1. ගොවි සංවිධාන<br>2. CMC සහCSIAP ව්‍යාපෘතිය<br>3.ගොවිජන සං . දෙපා.<br>4.පළාත් වාරි. දෙපා.<br>5. ප . කෘ. දෙ. |

# 5. මැඩිල්ල අමුණ එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම

# යෝජිත උපායමාර්ගික සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව

| උග්‍ර ගැටළු හා විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික ක්‍රියාකාරකම් | දළ පිරිවැය (රු.මි) | කාලරාමුව | | | | | | | | | | | | | | ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය මැදිහත් වීම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කෙටිකාලීන 2924 | | | | | | මධ්‍යකාලීන 2025 | | | | දිගුකාලීන | | | | | |
| | | | | | | | | | | | | | | | | ප්‍රධාන | අනෙකුත් |
| 1 වැවේ ජලය වගාවට ප්‍රමාණවත් නැත. වාන පහත් කරලා නියමිත මට්ටමට වාන ඉස්සීම.<br>පනාදරගමවැව<br>කුඩා වැව | 0.3 | | | | | | | ▬ | ▬ | ▬ | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග දෙ<br>5. කෘ දෙ | 1දේශගුණ සුහුරු වාරි කෘෂික ව්‍යාපෘතිය<br>2ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 2 කට්ටකඩුව හා පෙරණය නැත. නැවත ස්ථාපිත කිරීම<br>පනාදරගමවැව කුඩා වැ)<br>තම්මැන්නාව අංකිරිප්පව) | 0.2 | | | | ▬ | ▬ | ▬ | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග | 1ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |
| 3 රක්ෂිත අල්ලාගෙන ඇත වැවේ රක්ෂිතය සළකුණ කර අණවසර කරුවන් ඉවත් කිරීම<br>පනාදරගමවැව) කුඩාවැව<br>තම්මැන්නාව ඉහල වැව | 0.3 | | | | | | | | | ▬ | ▬ | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP | 1ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | 3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග | |
| 4 ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම. ඇල සකස් කිරීම (කුඹුරැ විනාශවී ඇත. පනාදරගම) | **0.4** | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග | 1ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |
| 5 වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවත සේදී වැවට එකතු වී වැව ගොඩවීම. පස් වැටිය සකස් කර පෙරණය දැමීම.<br><br>(wä 4 muK උස È. óg¾ 300පමණ) mkdor.u | **0.3** | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග | 1ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |
| 6 කෘෂි පාර නැත. කෘෂිපාර අලත්වැඩියාව (කට්ටකඩව සිට අංකිරිප්පව දක්වි මී 500 හා පකාදරගම වානේ සිට කුඹුරු දක්වා කෘෂිපාර නැත මී 750) | **0.7** | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග | 1ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |
| 7. අංකිරිප්පව පැවති වේල්ල කොන්ත්‍රාත් කරු ඉවත් කරලා අක් 01 ට ජලය ගන්න බැ. ඇල නැවත අලුත්වැඩියා කිරීම | **0.2** | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | 4. පළාත් වාරිමාර්ග | |
| 8 වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත.<br>නඩත්තුව ඉතා දුර්වලයි<br>විධිමත් නඩත්තු වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම. | **0.2** | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග | 1 ගොවි සංවිධාන/ ගොවීන්<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |
| 9 ආක්‍රමණික ජලජ ශාක නිසා වැව් ගොඩවීම.<br>ආක්‍රමණික ජලජ ශාක ජපන් ජබර,විල කටු | **0.2** | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං දෙ<br>4. පළාත් වාරිමාර්ග | 1ගොවි සංවිධාන/ ගොවීන්<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |

# 6.මැඩිල්ල අමුණ  එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තව

| අනු අංක | දළ ඇස්තමේන්තුගත වියදම / සහ<br>යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්  තම්මැන්නාව  එල්ලංගාව | ආසන්න වියදම්<br>(රු.) | 2024/2025 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඔ/නො | දෙ/ජන | මා/අප්‍රි | මැ/ජ | ජ/අ | සැ/ඔ | නෙ/දෙ | |
| 1 | 1 පනාදරගම වැවේ ජලය වගාවට ප්‍රමානවත් නැත)  .වාන පාහත්) | 0.3 | | | | | | | | |
| 2 | 2 කට්ටකඩුව හා පෙරණය නැත.<br>පනාදරගමවැව කුඩා වැවතම්මැන්නාව අංකිරිප්පව | 0.6 | | | | | | | | |
| 3 | 3 රක්ෂිත අල්ලාගෙන ඇත.<br>පනාදරගමවැව) කුඩාවැව තම්මැන්නාව ඉහල වැව | 0.4 | | | | | | | | |
| 4 | 4 ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම.( කුඹුරු  විනාශවී ඇත . පනාදරගම) | 0.4 | | | | | | | | |
| 5 | 5 පුණරුත්ථාපණයේදී වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවත සේදී වැවට එකතු වී වැව ගොඩවීම.)wä 4 muK උස  È. óg¾ 300 පමණ) mkdor.u | 0.4 | | | | | | | | |
| 6 | 6 කෘෂි පාර නැත ( කට්ටකඩව සිට අංකිරිප්පව දක්වි මී 500 හා පනාදරගම  වානේ සිට කුඹුරු දක්වා කෘෂිපාර නැත  මී 750) | 0.2 | | | | | | | | |
| 7 | අංකිරිප්පුව පැවති වේල්ල කොන්ත්‍රාත් කරු ඉවත් කරලා අක් 01 ට ජලය ගන්න බැ. | 0.2 | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත. නඩත්තු ඉතා දුර්වලයි. | 0.2 | | | | | | | | |
| 9 | ආක්‍රමණශීලී ජලජ ශාක නිසා වැව් ගොඩවීම. | 0.2 | | | | | | | | |
| | එකතුව | 2.4 | | | | | | | | |







ඇමුණුම්

ඇමුණුම් 01 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කරඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. 7/3/9/CMC/2023 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2023.08. 03

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>

**<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක විශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ විවිධ ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී පද්ධතීන් තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් පිරිමීම ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා අනෙකුත් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මඟ පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සෑම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

## <u>3.4. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවේ සංයුතිය</u>

### 3.4.1 <u>ප්‍රාදේශීය මට්ටම</u>

මෙම කමිටුව අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. ප්‍රාදේශීය ලේකම්
ii. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
iii. කෘෂිකර්ම උපදේශක
iv. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
v. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
vi. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
vii. ග්‍රාම නිලධාරී
viii. සමෘද්ධි සංවර්ධන නිලධාරී
ix. ආර්ථික සංවර්ධන නිලධාරී
x. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xi. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xii. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
xiii. පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
xiv. පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
xv. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xvi. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
xvii. වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරී
xviii. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xix. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xx. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xxi. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
xxii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
xxv. ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
xxvi. ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

xxvii. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධාරීයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
x. පළාත් සිවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරී හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරී හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරී
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරී හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

සැ:යු :- ***එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ ඒකකව වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

### <u>3.5. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම</u>

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

### <u>3.6. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම</u>

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමානායාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)